# නාගරික මතුපිට ජල පරාමිතීන්ගේ කාලීන සහ අවකාශීය විවිධත්වය විශ්ලේෂණය; නිරිතදිග බේරෙ වැව

*පබිදු ප්‍රියදර්ශන*[1]

ලොව ජනගහන වර්ධනය සමඟ නාගරීකරණය වේගවත්ව ඉහළ යයි. සාතීය නාගරීකරණයේ වර්ධනය ඉහළ වීම මත නාගරික පරිසරයට වන බලපෑම ඉහළ ය. මෙහිදී නාගරික ප්‍රදේශයන්හි මතුපිට ජල තලයන්ට වන බලපෑම ඉතා ඉහළ ය. එම පසුබිම මත කොළඹ නගරයේ අධිනාගරික පරිසරයක පිහිටි බේරෙ වැවෙ නිරිතදිග බේරෙ වැව පාදක කරගෙන ක්ෂේත්‍රීයව සහ කාලීනව ජල පරාමිතීන් වෙනස් වීම කෙරෙහි අවධානය යොමු කිරීමට මෙහිදී අවධානය යොමු විය. අධ්‍යයන ප්‍රදේශයේ නියැදි ස්ථානය 7ක් භාවිතයෙන් තෙත් සහ වියළි ඍතු ආවරණය වන පරිදි නියැදි රැස් කරන ලද අතර DO, $BOD_5$, TS, TSS, TDS, pH, දෘශ්‍යතාවය සහ උෂ්ණත්වය යන පරාමිතීන් ජලතලයෙහි ක්ෂේත්‍රීය සහ කාලීන වශයෙන් විශ්ලේෂණය කෙරිණි. ප්‍රාථමික දත්ත ඇසුරින් ක්ෂේත්‍රීය විවිධත්වය සඳහා අන්තර්නිවේශන ක්‍රමවේදය සහ කාලීන විවිධත්වය නිරූපණය කිරීමට සංඛ්‍යාන විද්‍යාත්මකව කල්පිත පරීක්ෂාවන් සිදු විය. නාගරීකරණය බලපෑම මත ක්ෂේත්‍රීය ව්‍යාප්තියෙහි ඍතුමය අනුව පැහැදිලි විවිධත්වයක් ගනු ලබය ආකාරය පැහැදිලිව සිතියම් තුළින් හඳුනාගත හැකිය. අධ්‍යයන පරාමිතීන් නාගරික පරිසරයක් තුළ හැසිරීමේ විවිධත්වය එයින් පැහැදිලිව නිරූපණය කරයි. කාලීනව ඍතුමය වශයෙන් pH සහ ඕ පරාමිතීන්ගේ පැහැදිලි විෂමතාවයක් පෙන්නුම් කළ ද අනෙකුත් ගණනය කරන ලද පරාමිතීන්ගේ විෂමතාවයක් හඳුනාගත නොහැකිය. අධිනාගරික පරිසරයක් තුළ පිහිටි ක්ෂේත්‍රීය ප්‍රදේශයක් වීම මත ජලයෙහි පරාමිතික ගුණාත්මක බව පිරිහී යාම හඳුනාගත හැකි අතර එය කාලීනව වර්ධනය වන්නකි. නාගරීකරණයේ ස්වභාවය මත එය තීරණය වෙයි. කළමනාකරණයෙන් තොර වූ නාගරික පරිසරය සහ මානව ආකල්පයන්හි දුර්වලතාවය මත මතුපිට ජල පරාමිතීන්ට එල්ල වන බලපෑම ඉහළ ය. එහෙයින් රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන අංශයන්හි දායකත්වය ලබා දෙමින් ජල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය විධිමත් පියවරයන් ගැනීම අත්‍යාවශ්‍ය ය. නාගරික පරිසරයක මතුපිට ජලයෙහි කාලීන සහ අවකාශීය විවිධත්වය, අධික වර්ධනය වන නාගරීකරණය සමඟ සම්බන්ධ කිරීම සහ එහි බලපෑම් සමඟ නාගරික ජලජ පරිසරයකට එල්ල වන අභියෝග මෙන් ම එතුළින් නාගරික පරිසරයේ සංරචක සඳහා එල්ල වන බලපෑම වර්තමානයේ මෙන් ම අනාගතයේ කෙබඳු අයුරින් පෙන්නුම් කරන්නේ ද යන්න හඳුනාගැනීමට අවකාශය උදා වෙයි.

***ප්‍රමුඛ පද:*** නාගරීකරණය, මතුපිට ජලය, ජල පරාමිතීන්, කල්පිත පරීක්ෂාව, ක්ෂේත්‍රීය විවිධත්වය, ඍතුමය විවිධත්වය

[1] භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය. pabidu1997@gmail.com